# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2362/46 - 2023 දෙසැම්බර් මස 13 වැනි බදාදා - 2023.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන සහ මිලේනියම් ඩ්‍රයිව්, අයි. ටී. පාර්ක්, මාලඹේ, 10115 යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 නොවැම්බර් මස 28 දින අංක 2360/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 10 වන ස්ථරයේ) ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන්,

    (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් අදාල විෂය ක්ෂේත්‍රයෙන් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත් වන පරිදි ප්‍රථම උපාධියක් ලබා තිබීම හෝ;

    (ආ) අදාල විෂය ක්ෂේත්‍රයෙන් SLQF සයවැනි හෝ ඉහළ ස්ථරයක යෝග්‍යතාවක් ලබා තිබීම හෝ;

    (ඇ) SLQF සයවැනි හෝ ඉහළ ස්ථරයක ට සමාන වන වෘත්තීය යෝග්‍යතාවක් ලබා තිබීම හෝ;

    (ඈ) උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන අධිකාරිය විසින් නියම කරන ලද පරිදි 0-4 පරිමාණයෙන් අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය 3.00 හෝ ඉහල ප්‍රමාණයක් සමග NVQ හත්වැනි ස්ථරය සම්පූර්ණ කර තිබීම.

    යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.


1A - PG 6568— 286 (2023/12)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (ජෛව වෛද්‍ය විද්‍යාව) |

ආචාර්ය ඒ. ඩී. **සුසිල් ප්‍රේමජයන්ත**,
අධ්‍යාපන අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.